**සීබැන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගම 2020**
-----------------------------------------------------------

**1.** මූල්‍ය ප්‍රකාශන
---------------

**1.1** මතය
-----

සීබැන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම
------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

කරුණු අවධාරණය කිරීම

සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවක් පැවතීම දක්වන මූල්‍ය ප්‍රකාශනවල 2.9 සටහන වෙත මාගේ අවධානය යොමු කරමි. කෙසේ වුවද, සමාගමේ අවසාන මව් සමාගම විසින් මෙම සමාගමට ස්වකීය මූල්‍යකරණ කටයුතු සිදු කිරීමට හැකියාව ලැබෙන කාලය වන තෙක් සමාගමට මූල්‍ය ආධාර ලබා දීමට එකඟ වී ඇත. එබැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම මත පිළියෙළ කරනු ලැබේ. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කර නොමැත.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරද නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පිළිබඳ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධ අභ්‍යන්තර පාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාගම ඉන්වෙන්ටරි කළමනාකරණය සහ වාර්තා තබා ගැනීම සඳහා ස්වයංක්‍රීය පද්ධතිය වෙනුවට, අතින් ක්‍රියාත්මක වන පද්ධතියක් භාවිතා කරයි. එමඟින්, ඉන්වෙන්ටරි කළමනාකරණය සහ පාලනය සම්බන්ධ අවදානම වැඩි කරයි. | සටහන් කර ගන්නා ලදී.<br><br>අප විසින් ඉන්වෙන්ටරි සඳහා අතින් ක්‍රියාත්මක කරන ක්‍රියා පටිපාටිය අනුගමනය කරන බැවින් ඉන්වෙන්ටරි කළමනාකරණයේ වගකීම ඒ ඒ විශ්‍රාම ශාලාවේ අදාළ නේවාසික කළමනාකරු වෙත පැවරේ. සමාගමේ විශාලත්වය සහ ධාරිතාවලට අනුව, මධ්‍යගත පද්ධති මෘදුකාංග සඳහා පිරිවැය දැරීමට අපට නොහැකිවීම හේතුවෙන් එම ක්‍රියා පටිපාටියම අනුගමනය කිරීමට අපට සිදු වේ. කෙසේ වෙතත්, අපි ප්‍රධාන කාර්යාල මට්ටමින් ඇතින් සිට සමස්තයක් වශයෙන් තොග මට්ටම් මාසිකව නිරීක්ෂණය කරන්නෙමු. සමාගමට නව පරිගණකගත කරන ලද පද්ධතියක් හඳුන්වා දෙන තුරු, දැනට පවතින අතින් ක්‍රියාත්මක කරන ක්‍රියා පටිපාටිවල පාලනය ශක්තිමත් කිරීමට සහ ඉන්වෙන්ටරි සම්බන්ධ අවදානම අවම කිරීමට අපි පියවර ගන්නෙමු. | ඉන්වෙන්ටරි කළමනාකරණයට අදාළව පවතින පද්ධති සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීමට සහ ඉන්වෙන්ටරි වලන අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම සඳහා ඉන්වෙන්ටරි මොඩියුල ක්‍රියාත්මක කිරීම සලකා බැලීමට නිර්දේශ කෙරේ. |
| (ii) | අමුත්තන්ගේ නිවාසවල ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම සඳහා සමාගම විසින් අමුත්තන්ගේ නිවාස සම්බන්ධයෙන් | සටහන් කර ගන්නා ලදී,<br><br>විශාලත්වය සහ ධාරිතාව සලකා බැලීමේ දී, අප දැනට භාවිතා කරන වෙන්කිරීමේ ක්‍රමය ප්‍රමාණවත් වේ. ප්‍රධාන කාර්යාලය මගින් සිදු කරන හදිසි චාරිකා සහ නිවාඩු නිකේතනවල | අමුත්තන්ගේ නිවාසවල වංචා සිදු වීමේ අවදානම මඟ හරවා ගැනීම සඳහා අමුත්තන්ගේ නිවාස සඳහා මධ්‍යගත වෙන් කිරීමේ |

| | | |
|---|---|---|
| මධ්‍යගත පාලන පද්ධතියක් ක්‍රියාත්මක කර නොමැත. | භාරකරුවන් පිළිබඳ සොයා බැලීම සඳහා අදාළ ප්‍රදේශයේ ලංකා බැංකු නිලධාරීන්ගේ සහාය ලබා ගැනීමෙන් මෙහි සඳහන් අවදානම අවම කිරීමට අපි කටයුතු කරන්නෙමු. තවද, ලංකා බැංකුව විසින් CCTV ස්ථාපනය කිරීමේ නිරතව සිටින අතර, භාරකරුවන් අධීක්ෂණය කිරීමට එය ද අපට උපකාර වනු ඇත. | ක්‍රමයක් හඳුන්වා දීම නිර්දේශ කෙරේ. |

### 1.5.2 නුසුදුසු තක්සේරු කිරීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් තවමත් භාවිතයේ පවතින රු.10,693,132 ක් වන වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇත. භාවිත කළ හැකි තත්ත්වය මත පදනම්ව, එම වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කිරීමට සමාගම විසින් අවශ්‍ය කටයුතු සිදු කර නොමැත. | සටහන් කර ගන්නා ලදී. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, භාවිතයට ගත නොහැකි වත්කම් මූල්‍ය ප්‍රකාශනවලින් ලියා හැරීමට අපි කටයුතු කරන්නෙමු. | තවමත් භාවිතයේ පවතින, සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කිරීමට නිර්දේශ කෙරේ. |

### 1.5.3 විගණනය සඳහා ලේඛනගත සාක්ෂි ඉදිරිපත් නොකිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | ඇඳිරි නීතිය පැනවීම හේතුවෙන් නිවාඩු නිකේතන වසා දමන ලද 2020 අප්‍රේල් සහ මැයි මාසවල ආදායම ලෙස හඳුනාගෙන ඇති පහත දක්වා ඇති ආදායම්වල සම්පූර්ණබව සහ නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා සමාගම විසින් ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ඉදිරිපත් කර නොමැත. | සාමාන්‍යයෙන් සිදු කරන පරිදි, මුලින්ම වෙන් කිරීම සිදු කරනු ලබන දිනය මත පදනම්ව ආදායම හඳුනාගනු ලැබේ. කෙසේ වෙතත්, COVID 19 වසංගතය හේතුවෙන් බොහෝ වෙන් කිරීම් අදාළ නේවාසික කළමණාකරු වෙත දැනුම් දීමෙන් අනතුරුව පසු දිනකට කල් දමා ඇත. ඒ සම්බන්ධයෙන් අප දැනුවත් නොවූවද, වෙන් කිරීම සිදු කරන ලද මුල් දිනය මත පදනම්ව ආදායම හඳුනාගෙන ඇත.<br><br>කෙසේ වුවද, අනාගතයේදී එවැනි වැරදි සිදු වීම වළක්වා ගැනීම සඳහා, නේවාසික කළමණාකරුගෙන් අවශ්‍ය තොරතුරු ලබාගෙන අපි ආදායම නිවැරදිව හඳුනා ගන්නෙමු. | අනාගත පරිශීලනය සඳහා උපකාරක ලියකියවිලි පවත්වාගෙන යාම නිර්දේශ කරනු ලබන අතර, ක්‍රියාත්මක කරන ලද පාලන ඵලදායී ලෙස බලපවත්වන බව සහතික කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් නිසි සැලකිල්ලක් දැක්විය යුතුය. |

| ස්ථානය | වටිනාකම (රු.) |
|---|---|
| අනුරාධපුරය | 13,091 |
| නුවර එළිය | 177,955 |
| කතරගම | 13,055 |
| දික්ඔය | 4,545 |
| එකතුව | 208,645 |

| | | | |
|---|---|---|---|
| (ii) | රට තුළ සිදු වන ස්වාභාවික විපත් හේතුවෙන් ඇති වන යුක්ති සහගත තත්ත්ව මත සම්පූර්ණ මුදල ආපසු ගෙවන ලෙස ඉල්ලා සිටීමට හෝ වෙන්කරවා ගැනීමේ දිනයන් කල් දමා ගැනීමට සමාගම තම ගනුදෙනුකරුවන්ට ඉඩ සලසා තිබුණ ද, මුදල් ආපසු ඉල්ලා සිටීමට හෝ වෙන්කරවා ගැනීමේ දිනය කල් දැමීමට හැකි කාලසීමාව පිළිබඳව සමාගම විශේෂයෙන් සඳහන් නොකරයි. එබැවින් සුවිශේෂී අවස්ථාවල දී, මුදල් ආපසු ගෙවීමේ ප්‍රතිපත්තියක් නොමැතිවීම පිළිබඳව නිරීක්ෂණය කළ හැකි විය. | ලංකා බැංකුවේ මුදල් ආපසු ගෙවීමේ ප්‍රතිපත්තිය අප සමාගමේ සාමාන්‍ය පරිචය වශයෙන් අපි අනුගමනය කරන්නෙමු. කෙසේ වුවද, කොවිඩ් වසංගතය හේතුවෙන් අගුලු දැමීම සිදු වූ කාලසීමා තුළ දී, අපි මෙම ප්‍රතිපත්තියෙන් බැහැරව, යම් මාසයකට අදාළව ආදායම ගණනය කිරීමේ දී, ගිණුම්කරණ කටයුතු සංකීර්ණ කළ, එම කාලය තුළ කර්මාන්තය තුළ පැවති පරිචයට අනුකූලව, වෙන්කරවා ගැනීම කල් දැමීමට හෝ මුදල් ආපසු ලබා ගැනීම සඳහා අමුත්තන් වෙත විකල්ප තෝරා ගැනීමක් ලබා දෙන ලදී. කෙසේ වුවද, එය එක් අනපේක්ෂිත තත්වයක් වූ අතර අනාගතයේදී නැවත එවැන්නක් සිදු නොවනු ඇත. | අදාළ සියලු තොරතුරු ඇතුළත් වන සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද මුදල් ආපසු ගෙවීමේ ප්‍රතිපත්තිය නිසි පරිදි පවත්වාගෙන යාමට නිර්දේශ කෙරේ. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වාර්තා කරන දිනට ආපසු අය කර ගත නොහැකි රු. **101,875** ක් වන උත්සව අත්තිකාරම් ශේෂයක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇත. | අවුරුදු **5** කට වඩා අඩු සේවයක් සහිත සේවකයින් සඳහා පවා උත්සව අත්තිකාරම් ලබා දීමට අවසර ලබා දුන් **2017** වර්ෂයට පෙර සිට රු. **101,875** ක් වූ මෙම උත්සව අත්තිකාරම් නොගෙවා හිඟව පැවති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන්, එවැනි සේවකයින් වැටුප් ලබා ගැනීමෙන් අනතුරුව, කිසිදු දැනුම් දීමකින් තොරව ඉල්ලා අස්වන විට, උත්සව අත්තිකාරම් ආපසු අය කර ගත හැකි වන පරිදි ගෙවීමක් (පාරිතෝෂිත දීමනාව වැනි) ලබා ගැනීමට ද ඔවුහු හිමිකම් නොලබති. වර්තමානයේ, අප විසින් මෙම ප්‍රතිපත්තිය වෙනස් කර ඇති අතර උත්සව අත්තිකාරම් ලබා ගැනිම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබන්නේ වසර **5** කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කරන ලද කාර්ය මණ්ඩලය පමණි. එබැවින්, ආපසු අය කර ගැනීමේ අපේක්ෂාවක් නොමැති බැවින්, ඉහත මුදල ලියා හැරීමට අවශ්‍ය අනුමැතිය (මණ්ඩල අනුමැතිය) ලබා ගැනීමට කටයුතු කරන්නෙමු. | ආපසු අය කර ගැනීමේ හැකියාව සැක සහිත වේ නම් හානිකරණය සඳහා ප්‍රතිපාදන සැපයීමට හෝ ශේෂය ලියා හැරීමට නිර්දේශ කරනු ලබන අතර ලැබිය යුතු ශේෂයන් වෙනුවෙන් ප්‍රමාණවත් පසු විපරම් කටයුතු සිදු කරනු ලබන බව සහතික කිරීම සඳහා නිසි පාලනයක් ක්‍රියාත්මක කිරීම නිර්දේශ කෙරේ. |
| (ii) | **2020** දෙසැම්බර් **31** දිනට දීර්ඝ කාලයක සිට නොගෙවා පවතින රු.**422,044** ක් වූ වැඩිපුර ගෙවූ | සටහන් කර ගන්නා ලදී. මෙම කාල සීමාව තුළ වැට් බදු අනුපාත ප්‍රතිශතය තුන් වතාවක් වෙනස් කිරීම නිසා මෙය සිදුවී ඇත. එබැවින්, | ආපසු අයකර ගැනීමේ හැකියාව සැක සහිත වේ නම්, හානිකරණය සඳහා |

| | | |
|---|---|---|
| වැට් බදු ශේෂයක් නිරීක්ෂණය විය. | අතිරික්ත මුදල සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නැවත හිමිකම් ඉල්ලා සිටීමට අපි කටයුතු සම්පාදනය කරන්නෙමු. එසේ නැතහොත්, යම් අවස්ථාවක අප වැට් බද්ද සඳහා වගකිව යුතු වුවහොත්, ඉක්මනින් එය හිලව් කිරීමට අපි කටයුතු කරන්නෙමු. | ප්‍රතිපාදන සැපයීමට හෝ ශේෂය ලියා හැරීමට නිර්දේශ කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 33.3 ක අලාභයක් වූ අතර පූර්ව වර්ෂයේ අනුරූප අලාභය රු. මිලියන 5.3 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 28 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධානම හේතුව වූයේ ආදායම සියයට 47කින් අඩුවීමයි.

### 2.2 ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

පූර්ව වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම විශ්ලේෂණය කිරීම සහ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය පහත දක්වා ඇත.

| විස්තරය | විචලනයේ ප්‍රමාණය වැඩිවීම / (අඩුවීම) (රු.) | විචලනය % | විචලනයට හේතුව |
|---|---|---|---|
| අවන්හල් ආදායම | (30,957,214.00) | (55%) | දිවයින තුළ පැවති COVID 19 වසංගතයෙන් පසුව ඇති වූ අහිතකර සාර්ව ආර්ථික තත්ත්ව හේතුවෙන් අවන්හල් ආදායම පහත වැටුණි. |
| වෙන්කිරීම්වලින් ලද ආදායම | (27,716,663.01) | (56%) | දිවයින තුළ පැවති COVID 19 වසංගතයෙන් පසුව ඇති වූ අහිතකර සාර්ව ආර්ථික තත්ත්ව හේතුවෙන් වෙන්කිරීම්වලින් ලද ආදායම පහත වැටුණි. |
| විකුණුම් පිරිවැය | (21,686,888) | (36%) | දිවයින තුළ පැවති COVID 19 වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපාර පරිමාව අඩු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් විකුණුම් පිරිවැය පහත වැටුණි. |

**2.3** අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති මූල්‍ය ප්‍රකාශන සහ තොරතුරුවලට අනුව, පූර්ව වර්ෂය හා සැසඳීමේ දී, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ ඇතැම් වැදගත් අනුපාත පහත දක්වා ඇත.

| ලාභදායිතා අනුපාත | 2020 | 2019 |
| --- | --- | --- |
| දළ ලාභ අනුපාතය (ප්‍රතිශතය) | 41 | 51 |
| ශුද්ධ ලාභ අනුපාතය (ප්‍රතිශතය) | (53) | (4) |
| මුළු වත්කම් මත ප්‍රතිලාභ | (56) | (10) |
| හිමිකම් මත ප්‍රතිලාභ | (87) | (105) |
| ද්‍රවශීලතා අනුපාතය (වාර සංඛ්‍යාව) | | |
| ජංගම වත්කම් අනුපාතය (වාර සංඛ්‍යාව) | 0.19 | 0.48 |
| ක්ෂණික වත්කම් අනුපාතය (වාර සංඛ්‍යාව) | 0.16 | 0.40 |

සමාලෝචිත වර්ෂය තුළදී සමාගමේ ශුද්ධ අලාභය ඉහළ යාම හේතුවෙන් පූර්ව වර්ෂය හා සැසඳීමේ දී. සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ සියලුම අනුපාත පිරිහීමකට ලක් වී ඇත.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පහත ස්ථාන සඳහා මුල් සහ අත්සන් කළ කළමනාකරණ ගාස්තු ගිවිසුම් නොමැති බව නිරීක්ෂණය විය.<br><br>ප්‍රවර්ගය — ස්ථානය<br>සීබෑන්ක් විශ්‍රාම ශාලා — අනුරාධපුරය, කතරගම, දික්ඔය<br>නිවාඩු නිකේතන — බණ්ඩාරවෙල, හපුතලේ, ලිඳුල, ත්‍රිකුණාමලය, කයිට්ස්, නාවල<br>විධායක නේ සැපයීමේ සේවය — -<br>සීටීඅයි මහරගම — -<br>ප්‍රධාන කාර්යාලය — කොළඹ - ආපන ශාලාව<br>කාර්ය මණ්ඩල නිල නිවාස | සටහන් කර ගන්නා ලදී. ලංකා බැංකුවේ උපදෙස් ලබා ගැනීම මගින් මෙම කරුණ නිවැරදි කරන්නෙමු. | අදාළ පාර්ශ්වය සමඟ නිසි පරිදි ගිවිසුම් පවත්වා ගැනීමට නිර්දේශ කෙරේ. |